# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 ජුනි මස 23 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු රවින්ද්‍ර යසස් කුමානායක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015.06.09දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/ VI / (1) / 15 / 22 )

(අ). බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ දෙපාර්තමේන්තුවට අයත් ආයතනවල, සේවය කළ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් කොපමණ සංඛ්‍යාවකට 2012, 2013. 2014 හා 2015 වර්ෂවල තීරුබදු රහිතව වාහන බලපත්‍ර ලබා දී ඇත්ද?

(ආ). එම නිලධාරීන්ගේ නාම ලේඛනය, ජාතික හැඳුනුම්පත් අංකය සහ උපන් දිනය සමඟ මෙම පළාත් සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

**02.** ගරු එම්.රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015.06.09දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/ VI / (1) / 15 / 23 )

(අ) මීගමුව අධ්‍යාපන කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා තනතුරට නියමිත සුදුසුකම් සපුරා ඇති අයෙක්ද?

(ආ) මෙම අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට එම තනතුර ලබා දීමට තීරණය කර ඇත්තේ එකී තනතුරට මනා සුදුසුකම් ඇති සුදුස්සන් මඟ හරිමින් බව ඔබතුමා පිළිගන්නේද?

(ඇ) මීගමුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද?

(ඈ) මෙම තැනැත්තා වෙනුවට සුදුසුකම් සහිත පුද්ගලයෙක් එම තනතුරට පත් කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

**03.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/ VI / (1) / 15 / 24 )

අ. i. බප/ කැළ/ ක්‍රිස්තුරාජ විදුහලේ ගොඩනැගිලි හා ඉඩමෙන් 2/3 කට ආසන්න ප්‍රමාණයක් දිස්ත්‍රික් 306/බී ජාත්‍යන්තර සිංහ සමාජයට බදු දී ඇති බව ඔබතුමා දන්නේද?

ii. එම බදු කාලය පසුගිය වසරේ අවසන්ව ඇති බව ඔබතුමා දන්නේද?

iii. මෙම ඉඩම හා ගොඩනැගිලි නැවත පාසලට පැවරීමට බස්නාහිර පළාත් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2015.03.14 වන දිනත් කැළණිය කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(පාසැල් පරිපාලන හා සේවා) 2015.02.16 දිනත්, නිර්දේශ කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ආ i. දෙමව්පියන් විදුහල්පතිතුමන් හා අධ්‍යාපන නිලධාරීන් දිගින් දිගටම ඉල්ලීම් කර තිබියදී මේ වනතෙක් මෙම ඉඩම හා ගොඩනැගිලි පාසල වෙත නැවත පවරා දීමට පියවර ගෙන නැත්තේ කුමන හේතුවක් මතද?

ii. මේ වනවිට පාසලේ ප්‍රාථමික අංශය පවත්වාගෙන යාමට ඉතිරිව ඇත්තේ පර්චස් 20 ක පමණ සීමිත ඉඩක් බැවිනුත්, ගොඩනැගිලි අබලන් බැවිනුත් මෙම ඉඩම හා ගොඩනැගිලි නැවත පාසල වෙත පවරා දීමට පියවර නොගන්නේ මන්ද?

**04.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :

(ප්‍ර/ VI / (1) / 15 / 25 )

අ i. කැළණිය අධ්‍යාපන කලාපයට අයත් කරුණාරත්න බෞද්ධ ප්‍රාථමික විද්‍යාලයේ 3 ශ්‍රේණියේ සමාන්තර පන්ති කියක් තිබේද?

ii. එම පන්තිවල ළමුන් කී දෙනෙක් සිටිද?

ආ i. මෙම ළමුන්ගේ පෞද්ගලික ලිපිගොනුව (උප්පැන්න සහතිකයද අඩංගු) සියල්ල අස්ථානගතවී ඇති බවට ඔබතුමා වෙත වාර්තා වී තිබේද?

ii. 2015.06.08 වන දින මෙම පාසැලේ විදුහල්පතිවරයා විසින් 3 ශ්‍රේණියේ දෙමව්පියන් කැඳවා මෙම සියලු දරුවන්ගේ උප්පැන්න සහතික අස්ථානගතවී ඇති බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නැවත උප්පැන්න සහතික ගෙනවිත් බාර දෙන ලෙසත් දන්වා ඇති බව ඔබතුමා දන්නේද?

iii. එය එසේ සිදුවී තිබේනම් මේ පිළිබදව විමර්ශනයක් සිදු කර අදාල වගකිවයුත්තන්ට එරෙහිව පියවර ගන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අයකිරීම් සිදුවේ. පලමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත්කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතුකිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත. එබැවින් බස්නාහිර පළාත තුල දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතුකිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/VI (1) /14/09)

### 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා:

" බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත්කර ගැනීමේදී දරුවන් හා දෙමවුපියන් පීඩාවට පත්කරන වර්තමාන ක්‍රමවේදය වෙනස්කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුලත්කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්‍ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුලත් කර ගත් දිනයේ සිට සති 3 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්‍ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛණයට අනුව ළමුන් ඇතුලත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරිමත්, සම්මුඛ පරීක්‍ෂණ වලට සහභාගි වන සැම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කිරිමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුලත් කිරිමට පියවර ගැනිමත් කළ යුතුයැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පලමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුලත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

(යෝ /VI (1) /14/10)

## X. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.06.10 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.